අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

## උපදෙස් පත්‍රිකාව

### 1. <u>ආගමික කටයුතු කුසලතා ඇගයීම</u>

මෙම නිපුණතා ඇගයීම පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ යන අංශ හතර සඳහා ම පැවැත්වේ. විනිශ්චය මණ්ඩලය මගින් ඉදිරිපත් කරනු ලබන ආගමික කටයුත්තක් සම්ප්‍රදායානුකූල ව ඉදිරිපත් කළ යුතු ය.

### 2.1. අභිමතාර්ථ

I. ශාසනික අවශ්‍යතා ශ්‍රාවක ප්‍රසාදය වැඩි වන අයුරින් නිවැරදිව හා අවබෝධයෙන් ඉටු කිරීමට අවශ්‍ය ශාසනික ව්‍යවහාර කුසලතාව දියුණු කිරීම.
II. පිළිවෙළ හා සම්ප්‍රදාය උල්ලංඝනය නොකොට ශාසන ගෞරවයෙන් ආගමික කටයුතු කිරීමේ හා කරවීමේ හැකියාව දියුණු කිරීම.

### 2.2. ඇගයීම් කොන්දේසි

I. එම අවස්ථාවේ දී විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන ඉදිරිපත් කිරීමක් කළ යුතු ය.
II. එක් අපේක්ෂකයෙකුට විනාඩි 07ක කාලයක් හිමි වේ.
III. පිළිවෙළ හා සම්ප්‍රදාය අනුව අදාළ ඉදිරිපත් කිරීම කළ යුතු ය.
IV. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසානාත්මක වේ.
V. ජාතික මට්ටම දක්වා ම පහත තේමා යටතේ අදාළ ඉදිරිපත් කිරීම් කළ යුතුය.

- තිසරණ පන්සිල්හි පිහිටුවීම
- උපෝසථ අෂ්ටාංග ශීලයෙහි පිහිටුවීම
- වන්දනා ගාථා නිවැරදි ව පිළිවෙළට කියවීම
- බුද්ධ පූජා පැවැත්වීම (කවියෙන් පූජාව පැවැත්වීමට ලකුණු හිමි නොවේ.)
- බුද්ධ වන්දනා කරවීම (කවියෙන් පූජාව පැවැත්වීමට ලකුණු හිමි නොවේ.)
- පිං වාක්‍යය කියවීම
- දානය, ගිලන්පස හා මතක වස්ත්‍ර සාංඝික කිරීම

### 2.3 ලකුණු ලබා දීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| i. | පිළිවෙළ නොබිඳීම | 10 |
| ii. | සම්ප්‍රදාය සුරැකීම | 10 |
| iii. | අක්ෂර හා වචන නිරවද්‍ය උච්චාරණය | 10 |
| iv. | ශ්‍රවණ මාධූර්යය | 10 |
| v. | ශ්‍රමණ සාරූප්‍යයෙන් යුතු ව ඉදිරිපත් කිරීම | 10 |
| | මුළු ලකුණු | 50 |